# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | DFD/Cir/2015/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | |
| දිනය / திகதி / Date | 06.03.2015 | | |

සාමාන්‍යාධිකාරී - ලංකා බැංකුව
සාමාන්‍යාධිකාරී - මහජන බැංකුව
සාමාන්‍යාධිකාරී - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
සාමාන්‍යාධිකාරී - ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව

මහත්මයාණෙනි

**<u>2015 අයවැය යෝජනා - ගොවීන් විසින් රාජ්‍ය බැංකුවලින් ලබාගත් වගාණය සඳහා සහන</u>**

ඔබ දන්නා පරිදි, 2015 අතුරු අයවැය මගින් ගංවතුර, නියඟය, කෘමි වසංගත, ස්වභාවික උපද්‍රව හා සිවිල් කෝලාහල වැනි පාලනය කළ නොහැකි සාධක හේතුකොටගෙන සිදු වූ අස්වැන්න අහිමිවීම හේතුවෙන් ගොවීන් විසින් රාජ්‍ය බැංකුවලින් ලබාගත් වගාණය මුදලෙන් 50% ක් කපාහැරීමට යෝජනා කරන ලදි. ඒ අනුව, පහත සඳහන් මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව 2015.02.01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලෙස බැංකු වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

1. රාජ්‍ය බැංකුවකින් රුපියල් 100,000/- උපරිමය දක්වා කිසියම් වගාණය යෝජනා ක්‍රමයක් යටතේ වී ඇතුලූ අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගාකිරීම සඳහා ණය ලබාගෙන 2015.01.31 දින වන විට අක්‍රීය ගණයට මාරුකරන ලද ණය ලබාගත් ගොවීන් මෙම සහනය ලබාගැනීම සඳහා සුදුසුකම් ලබයි.

2. තනි පුද්ගලයෙකු විසින් එක් බැංකුවකින් ලබාගත් ණය සංඛ්‍යාව නොසලකා රුපියල් 100,000 ක උපරිම සමුච්චිත ණය සීමාවකට යටත්ව එක් වරක් පමණක් මෙම සහනය භුක්තිවිඳීමට හැකි වේ.

3. සමුච්චිත හෝ තනි පුද්ගල ණය ප්‍රමාණය රුපියල් 100,000/- ඉක්මවන්නේ නම් මෙම සහන පැකේජය යටතේ සලකා බැලීමට සුදුසුකම් නොලබයි.

4. බැංකුව විසින් අක්‍රමික ණයට මාරුකර ඇති මුළු නොගෙවූ වගා ණය ප්‍රාග්ධනයෙන් 50% ක් කපාහැරිය යුතුය. මහා භාණ්ඩාගාරය විසින් අදාළ බැංකුව වෙත අලාභය ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

5. ඉහත ණය සඳහා අදාළ දඩ පොළිය බැංකුව විසින් කපාහැරිය යුතු අතර එහි අලාභය බැංකුව විසින් දැරිය යුතු වේ.

6. බැංකු විසින් එක් එක් මාසයක් තුළ කපාහරින ලද මුළු ණය මුදල , අභ්‍යන්තර විගණකගේ තහවුරුකිරීමෙන් අනතුරුව මුදල් අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත සෑම මාසයක් අවසානයේ දීම ඉදිරිපත් කළ යුතුය. මුදල් අමාත්‍යාංශය විසින් ඊළඟ මාසයේ පළමු සතිය ඇතුළත අදාළ මුදල ප්‍රතිපූර්ණය කරනු ලබයි.

7. බැංකුව විසින් මෙම සහන පැකේජය සඳහා සුදුසුකම් ලබන සෑම පුද්ගලයෙකුම පෞද්ගලිකව දැනුවත් කළ යුතුය.

8. මෙම සහනයන් ලබාදීම වහාම ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත තොරතුරු ඇතුලත් අභ්‍යන්තර චක්‍රලේඛණයක් 2015.03.10 හෝ ඊට පෙර සෑම බැංකු ශාඛාවක් වෙතම නිකුත් කළ යුතුය.

මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

මෙයට විශ්වාසී

ආචාර්ය ආර් එච් එස් සමරතුංග
භාණ්ඩාගාර ලේකම් හා
මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත : 1. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව - කා දැ. ගැ. ස.
2. අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව - අ. ක. ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - අ. ක. ස.
4. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - අ. ක. ස.